# අහෝ දෙව්දත් නොදිටි මොක්පුර

“කපිල පීරිස් මහතා දැන් දැන් ඉතා පැහැදිලිව ම අපේ මතවාදයට ප්‍රතිවිරුද්ධ මතවාදයක් ගෙනහැර දක්වනවා පමණක් නොව අපේ මතවාදය සංශෝධනය කරමින් වෙනත් මතවාදයක් ඉදිරිපත් කරයි” යනුවෙන් ඒ මහතාගේ නම සඳහන් කරමින් මා ලියූ පළමු ලිපියෙහි ම (සැප්තැම්බර් 30) සඳහන් කෙළෙමි. මා ඒ ලිපිය ලිටුවේ ඔහු මගේ නම මුලින් ම සඳහන් කර ලියූ ලිපිය (සැප්තැම්බර් 9) පළ වී සති කිහිපයකට පසුව ය. ඔහු සමග විවාදයකට එළඹීමට මට අවශ්‍යතාවක් නො වී ය. ඔහු කවුදැයි මම හඳුනාගෙන සිටියෙමි. මට අවශ්‍ය වූයේ ඔහුගේ දුර්මතවලට ඔහුගේ නම සඳහන් නොකර පහර දීමට ය. ඒ ඔහුගේ මතවලින් අපේ ප්‍රවාදවලට එරෙහිව  සෘජුව ම අඳබාල චෝදනා ඉදිරිපත් කෙරුණු නිසාත් ඔහු අපේ මත සමග එකඟවන්නකු ලෙස සාමාන්‍ය පාඨකයා දැන සිටි නිසාත් ය. ඔහුගේ මතවලින් වන හානිය වැළැක්වීම මගේ අරමුණ විය.

කපිල පීරිස් මහතා දිගින් දිගට ම අපට විරුද්ධවන බව සැඟවී ය. ඔහු අපෙන් බොහෝ දේ ඉගෙන ගත් බව පැවසී ය. නිව්ටන්ගේ ලෝකයෙන් මහු මුදාගැනීම පිළිබඳ ව අපට පිං දුන්නේ ය. එහෙත් ඒ සියල්ල යටින් ඔහුගේ වෛරය නිතර නිතර ඉස්මතු විය. ඔහු ඔළුව අතගගා හීං ටොකු අනින්නකු බවත් අපේ දැනුමට ද්‍රෝහියකු බවත් කුහකයකු බවත් මම කීවෙමි. අද ඒ සියල්ල සත්‍ය බව ඔහු ම පෙන්වා දෙයි. ඔහු පසුගිය 11 වැනි දා පළ වූ අපි මුලට යමු ලිපියෙන් ඔහු නිර්මාණාත්මක සාපේක්ෂතාවට සියේට සීයක් එකඟ නොවන බව පවසයි. ඔහු තවමත් නොකියන්නේ ඒ සමග කිසිම එකඟතාවක් නැති බව පමණ ය. නිර්මාණ සාපේක්ෂතාවාදය දැඩි විඥානවාදී අගාධයක ගිලී ඇති තැන් පිළිබඳ ව ක්‍රමයෙන් පෙන්වා දෙන්නේ යැයි කියයි. ඇතැම් අපේ ප්‍රවාදවල ප්‍රලාප පෙන්වා දීමට ද ඒ මහතා සූදානම් ය. එසේ ම ඔහුගේ මිතුරකු වූ උදයසිරි වික්‍රමරත්න මහතාට අනුව මා දැන් වන විට බෞද්ධයකු නොව නිර්මාණාත්මක සාපේක්ෂතාවාදියකු බව ද සඳහන් කරන්නේ ඒ අනුමත කරමින් ය. මා දැන් නිර්මාණාත්මක සාපේක්ෂතාවෙහි සිට බුදුදහම දෙස බැලීමට උත්සාහ ගන්නා බව ද එහෙත් නිර්මාණාත්මක සාපේක්ෂතාවෙන් බුදුදහම නොව අපේ එදිනෙදා ප්‍රායෝගික දැනුම් ද විස්තර කළ නොහැකි බව ද පවසයි. ඔහු ඒ සඳහා දක්වන උදාහරණයෙන් ඔහුගේ තරම තේරුම්ගත හැකි වෙයි. නිව්ටන්ගේ නියම අපේ කර ගැනුම එයට ගෝචර නොවේ යැයි ඔහු පවසයි. ඒ අතර බෞද්ධ සංවර්ධන රාමුව ද නිර්මාණාත්මක සාපේක්ෂතාවෙහි ප්‍රතිඵලයක් ලෙස සැලකීම ගැටළුවක් බව පවසා ඒ සැණින් ම ඒ එතරම් ගැටළුවක් නොවන බව පවසන්නේ ඔහුට එවායෙහි අයිතිකරු, හිමිකම, පරවේණිය ආදිය පිළිබඳ ගැටලුවක් නොමැති නිසා යැයි ද කියයි. කපිල පීරිස් මහතා හීං ටොකු අනින්නකුට වඩා හැකිනම් මගේ ඔළුව පැලීමට සූදානමින් සිටින්නකු බව ඉහත සඳහන් බොරු සහ විලම්බීතවලින් පැහැදිලි වෙයි. එහෙත් ඔහු තම කුහකවත තව තවත් ප්‍රදර්ශනය කරමින් ඒ එසේ නොවන බව කියනු ඇත. තර්ක නොකරන්නේ යැයි කියමින් තර්ක කරන කුහකයකුට කිව නොහැකි බොරුවක් නැත. ඔහුට අද ඔහු කියා ඇති දේ දිරවාගත නොහැකි වී ඇත. ඉතා කෙටියෙන් කිවහොත් කපිල පීරිස් මහතාට අත් වී ඇත්තේ ද තම තරමට වඩා පිම්බෙන්නට ගිය ගෙම්බාට අත් වූ ඉරණම ය. කපිල පීරිස් මහතා කර ඇත්තේ ඉතා සුළු වරදක් පමණක් යැයි කියන්නවුන් දැන්වත් ඔහුගේ තරම දැනගත යුතු ය.

උදයසිරි වික්‍රමරත්න මහතාගේ දාර්ශනික දැනුම ගැන අමුතුවෙන් කතාකළ යුතු නො වේ. ඔහුට නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය පිළිබඳ අබමල් රේණුවක තරමකවත් දැනුමක් නැත. ඔහු මිනුම් දණ්ඩක් ලෙස ගැනීමට පෙළඹී ඇති කපිල පීරිස් මහතා ගැන ද එවිට කීමට ඇත්තේ එපමණ ය. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය යනු බුදුදහමට විකල්පයක් නොව සිංහල බෞද්ධ චින්තනය මත පදනම් ව දැනුම් නිර්මාණය හා දැනුමේ සාපේක්ෂතාව පිළිබඳ නිර්මාණය කෙරුණු ප්‍රවාදයකි. දැනුමේ සාපේක්ෂතාව ගැන බොහෝ දෙනා කතාකර ඇත. දැනුම යනු සොයාගන්නක් නොව නිර්මාණය කෙරෙන්නක් බව තවත් අය සඳහන් කර ඇත. මා විසින් කෙරී ඇත්තේ දැනුම යනු නිර්මාණය කෙරෙන්නක් බව ද ඒ නිර්මාණය කෙරෙන්නේ මනසට, අනෙක් ඉන්ද්‍රියවලට හා සංස්කෘතියට සාපේක්ෂව බව ද නිදසුන් සහිතව පෙන්වා දීම ය. එපමණක් නොව මිනිසුන් දැනුම නිර්මාණය කරන්නේ අවිද්‍යාව නිසා, එනම් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම අනාවබෝධය නිසා බව ද නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙහි කියැවෙයි. මිනිසුන් දැනුම නිර්මාණය කරන්නේ සංකල්ප, ප්‍රවාද ආදිය ආශ්‍රයෙන් බව ද ඒ සංකල්ප ආදී සියල්ල ශූන්‍ය බව ද එහි කියැවෙයි. වෙනත් වචනවලින් කිවහොත් සංකල්පීය ලෝකය ශූන්‍ය බව එහි කියැවෙයි. තවද දැනුම නිර්මාණය කෙරෙන්නේ චින්තනයක් මත පදනම් වී බව ද එකම චින්තනයක් පදනම් කරමින් විවිධ ක්ෂෙත්‍රවල නිර්මාණය වන දැනුම් එකිනෙකට බැඳී ඇති

© Prof. Nalin De Silva

බව ද එහි සඳහන් වෙයි. මෙහි බුදුදහම සමග ඇති ප්‍රශ්නයක් නැත. මම බෞද්ධයෙක් මි. එමෙන් ම නිර්මාණාත්මක සාපේක්ෂතාවාදියෙක් වෙමි. බුදුදහම හා නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර නො වේ.

බෞද්ධ සංවර්ධන රාමුව පමණක් නොව එවැනි කිසිවක් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙහි ප්‍රතිඵලයක් නො වේ. යමක් තවත් දෙයක ප්‍රතිඵලයක් වන්නේ දෙවැන්න පළමුවෙන් ලබාගත හැකි නම් ය. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය යොදාගෙන බෞද්ධ සංවර්ධන රාමුව ලබාගත හැකි නො වේ. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙන් කෙරෙන්නේ මිනිසුන් දැනුම නිර්මාණය කරන බව හා ඒ කරන්නේ කෙසේ ද යන්න පැහැදිලි කිරීම ය. දැනුම නිර්මාණාය කිරීම පිළිබඳ වූ ප්‍රවාදයකින් සංවර්ධන රාමුවක් පිළිබඳ දැනුමක් ලබාගත නො හැකි ය. කපිල පීරිස් මහතා දර්ශනය තබා ප්‍රතිඵලය යන වචනය යොදාගන්නේ කිනම් අවස්ථාවක ද යන්නවත් නො දනියි. අපට දර්ශනය ගැන කතාකරන්නට වී ඇත්තේ එවැන්නන් සමග ය! මම බුදුදහමට විවරණ කරමි. එහෙත් ඒ කරන්නේ ද නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙහි සිට බුදුදහම දෙස බැලීමෙන් නො වේ. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙන් කියැවෙන්නේ දැනුම නිර්මාණය කිරීමේ දී බලපාන කරුණු ය. බුදුදහම පිළිබඳ විවරණ ලියූ පළමු තැනැත්තා හෝ අවසාන තැනැත්තා හෝ මම නො වෙමි. ඒ විවරණ ගැන කතාකිරීම මට ප්‍රශ්නයක් නො වේ. මා ඒ උපක්‍රමශීලීව මගහැර නැත. අවශ්‍ය විට ඒ ගැන විස්තරාත්මක ව කතා කරමි. එහෙත් නිවන පිළිබඳ මම කිසිවිටෙක විවරණයක් කර නැත්තෙමි. නිවන යනු මේ යැයි මා කියා ඇති තැනක් නැත. බුදුන් වහන්සේ නිවන යනු මේ යැයි වචනයෙන් විස්තර කර නැත. එසේ වූ කල මම කෙසේ නිවන විස්තර කරන්නෙමි ද? එහෙත් වචනයෙන් නිවන විස්තර කළ හැකි බව කියන පඬියෝ මෙරට වෙති. මෙන්න මේ පඬියෝ නම් බුදුදහම විකෘත කරන්නෝ වෙති. බුදුන්වහන්සේ නිවන වචනයෙන් විස්තර කර ඇති තැනක් පෙන්වන ලෙස මා ඔවුන්ට අභියෝග කර ඇතත් ඔවුහු එහි දී නම් ඔවුහු මුනිවත රකිති.

නිවන් අවබෝධ කරන්නේ මනසින් ද? මා නැගූ ප්‍රශ්නය එයයි. ඒ ප්‍රශ්නයට පිළිතුරු සෙවීමට නිවන් අවබෝධ කළ යුතු නො වේ. මනස යනුවෙන් යමක් පවතින්නේ ද? එවැනි යමක් පවතින්නේ නම් සියල්ල ඒ මනසේ නිර්මාණ නම් එතැන විඥානවාදයක් වෙයි. මනස යනුවෙන් ද යමක් නො පවතී යැයි කියන විට ඒ විඥානවාදයක් වන්නේ කෙසේ ද? නිවන් අවබෝධ කරගන්නේ පවත්නා මනසකින් නම් ඒ පවත්නා මනස නැතිකළ හැකි නොවන්නේ ඒ උච්ඡේදවාදයට හසුවන බැවිනි. අනෙක් අතට මනස නැති නොකර දිගින් දිගට ම පවතින්නේ නම් ඒ ශාස්වතවාදයට යටත්වෙයි. එවිට පරිනිර්වාණයෙන් පසුව ද මනස වෙයි. අපට ඒ නිගමනවලට එමට නිවන් අවබෝධවන තුරු බලා සිටිය යුතු නො වේ. නැති මනස නැති මනසක් බව නැති මනසින් අවබෝධකර ගැනීම යන්න ලැබෙන්නේ ඒ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී ය. අප කළ යුත්තේ එය බුද්ධදේශනාව සමග වෙනස්වන්නේ නම් ඒ කෙසේ දැයි සළකා බැලීම පමණකි. අනෙක් අතට නාම රූප ඇතිවන්නේ මනසට සාපේක්ෂව ය. අපට නිවන් දැකීමේ දී ප්‍රශ්නය වන්නේ ද මනස ය. මනස නිසා ම අපට නිවන් අවබෝධය දුරස් වෙයි. මනසින් තොරව ඊනියා ක්ෂණයකට වුවත් ධර්මයක් පවතින්නේ නම් හා ඒ පැවැත්ම පිළිබඳ දැනුම මනසට සාපේක්ෂ නොවේ නම් අපට නිවන් දැකීමේ දී ඒ ප්‍රශ්නයක් නොවිය යුතු ය. මනසට සාපේක්ෂ නොවී මනසින් තොරව පවත්නා දේ ඇත්නම් ඒ ගැන අපට කරදර වීමට අවශ්‍ය නොවන්නේ නිවන් අවබෝධ කරගැනීමේ දී ඒ ප්‍රශ්නයක් නොවන නිසා ය. එහෙත් අප එවැනි දේ ගැන දන්නේ ද මනසිනි. යමක් මනසට සාපේක්ෂ නම් හා මනසින් තොරව ඒ නොපවතින්නේ නම් අපට නිවන් අවබෝධයේ දී ඒ ප්‍රශ්නයක් වෙයි. ක්ෂණය පමණක් නොව ක්ෂණයක දී පවතින ධර්ම ද මනසට සාපේක්ෂ වෙයි. ඒ මනසින් තොරව (ස්වායත්තව) පවතින්නේ නො වේ. ක්ෂණවාදය හා ධර්මවාදය පිළිබඳ ප්‍රශ්න පැන නගින්නේ එපරිදි ය. එදා ථෙරවාදීන්ගෙන් මාධ්‍යමිකයන් ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු නොතිබූ බැවින් ථෙරවාදීහු ආරක්ෂාකාරී පියවර ගත්හ. එහෙත් අද අපට ක්ෂණවාදය හා ධර්මවාදය ගැන ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දිය හැකි ය. අප තව දුරටත් ඒ පිළිබඳ ව නිහඬ ව සිටිය යුතු නො වේ.

නිව්ටන්ගේ නියම අපේ කරගන්නේ කෙසේ ද? කපිල පීරිස් මහතා කියන්නේ නිව්ටන්ගේ නියම අපේ කරගැනීම නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයට ගෝචර නොවන බව ය. එසේ කියා “මෙහි දී නිර්මාණාත්මක සාපේක්ෂතාව අතිශය විසද්කදාණවාදී අගාධයකට ඇද වැටේ” යැයි කපිල  පීරිස් මහතා පසුගිය 11 වැනි දා ලිපියෙන් කියයි. මේ නිගමනයේ කිසිම පදනමක් නැත. ඒ කපිල පීරිස් මහතාගේ හිතළුවක් පමණකි. මා සඳහන් කර ඇත්තේ නිව්ටන් නිව්ටන්ගේ ලෝකයෙන් මුදාගැනීම පිළිබඳ අදහස ලැබෙන්නේ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙන් බව ය. එයට හේතුව නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයට අනුව කලින් කියා ඇති පරිදි එක් චින්තනයක් මත පදනම් වි විවිධ ක්ෂේත්‍රවල නිර්මාණය වන දැනුම් එකිනෙකට බැඳී තිබීම ය. කපිල පීරිස් මහතා ද ඒ බව පිළිගනියි. ඔහුට අනුව

© Prof. Nalin De Silva

"නිව්ටන් නියම අපේ කර ගැනුමෙහි අපේ කර ගැනුම යන්න පිළිබඳ මූලික අදහස එන්නේ නිර්මාණාත්මක සාපේක්ෂතාවෙන් බව අවිවාදිත ය." එසේ නම් ප්‍රශ්නය කුමක් ද? කපිල පීරිස් මහතා නිව්ටන්ගේ නියම අපේ කර ගන්නේ ඉන් යථාර්ථය ඉවත් කිරීමෙනි. ඔහුට ඒ පිළිබඳ ව බුද්ධදහමින් හෝ වෙනත් තැනකින් හෝ ලබාගත් ප්‍රවාදයක්, විධික්‍රමයක් නැත. ඔහු එය කිසිදු පදනමක් නැතිව ප්‍රකාශ කරයි. අපි මුලට යමු යනුවෙන් ඔහු කියන්නේ ඔහුගේ ලිපිවල එවැන්නක් තිබූ බවක් පාඨකයාට හැගෙන පරිදි ය. එහෙත් කිසිදු ලිපියක නිව්ටන්ගේ නියමවලින් යථාර්ථය හෝ දෙවියන් වහන්සේ හෝ ඉවත් කරන්නේ කෙසේ දැයි පවසා නැත. කපිල පීරිස් මහතා කී පමණින් නිව්ටන්ගේ නියමවලින් දෙවියන් වහන්සේ ඉවත් වී නො යයි. බලය යන්න ම අවසානයේ දී දෙවියන් වහන්සේ මත පදනම් වෙයි. නිව්ටන්ගේ නියමවලින් යථාර්ථය ඉවත්කිරීමට නොහැකි නිසා නිව්ටන්ගේ නියම අපේ කරගත නොහැකි යැයි අප කියන විට ඉන් කියැවෙන්නේ ඊනියා අපේ කර ගැනුම නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයට ගොදුරු නොවන්නක් නොව කපිල පීරිස් මහතා හඬගා කී පමණින් දෙවියන් වහන්සේ ඉවත් නොවන බව ය. අනෙක් අතට නිව්ටන්ගේ ලෝකයෙහි ශක්ති සංස්ථිථි නියමය, ඊනියා නිරපේක්ෂ අවකාශය ආදිය ද දෙවියන් වහන්සේ හා බැඳී ඇත. කපිල පීරිස් මහතාට අනුව ඕනෑම බටහිර විද්‍යාවක් අපේ දැනුමක් බවට පත්කර ගැනීමට කළ යුත්තේ ඉන් යථාර්ථය ඉවත්කරන්නේ යැයි පැවසීම පමණකි. මේ කිසිසේත් දැනුම් මංකොල්ලයක් නොව තම හැකියාවන් ගැන ඇති අධිතක්සේරුවක් පමණ ය.

ඉංජිනේරු ක්ෂෙත්‍රයෙහි අපේ දැනුම් නොමැතිවීම හිතුවක්කාර ලෙස නිව්ටන්ගේ නියම යොදාගැනීමට හේතුවක් නො වේ. වෙදකමෙහි අපේ ප්‍රවාද ඇත්නම් අපට යම් තරමක හෝ පදනමක් ඇත. එවැනි පදනමක් ගැන දැනුමක් නොමැතිව නිව්ටන් යොදාගැනීම යනු අප මුළුමනින් ම නිව්ටන්ට යටකිරීමකි. ඒ ද්‍රෝහි කමක් බව මම නැවත නැවතත් කියමි. කපිල පීරිස් මහතා කරන්නේ මිව්ටෝනීය ආධිපත්‍යය තහවුරු කිරීම පමණ ය. බයිසිකලය නිපදවූ බටහිරයෝ ඉන් නොනැවතුනහ. ඔවුහු ඉන්ධන යොදන මෝටර බයිසිකලය ද නිපදවූහ. තව තවත් වාහන නිපදවූහ. මා කලින් කියා ඇති පරිදි කපිල පීරිස් මහතා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය යැයි කියන්නේ අපේ ජීවන රටාවට ය. ඒ දෙක අතර බැඳීමක් තිබෙන නමුත් ඒ දෙක එකක් නො වේ. කපිල පීරිස් මහතා අපේ ඉංජිනේරු සම්ප්‍රදාය සොයාගැනීමට අදහස් කරන්නේ නිව්ටන්ගේ නියම භාවිතා කිරීමෙනි. අනෙක් අතට ඔහු අපේ ඉංජිනේරු සම්ප්‍රදායේ වැදගත්කම අදාළ පුද්ගලයන්ට (ගැමියන්ට හා නිලධාරීන්ට) පෙන්වන්නේ නිව්ටෝනීය ලෝකයෙහි ය (මේ චක්‍රිය චින්තනයක් නොව පොර වීමට ගොස් පොට පටළවා ගැනීමකි. ඔහුගේ ඔක්තෝබර් 14 වැනි දින ලිපියේ තුන්වන ඡේදය බලන්න). ඒ ඒ ක්ෂෙත්‍රවල නිව්ටන්ගේ නියම යෙදීම යනු මේ පටලැවිල්ල මිස වෙනත් දෙයක් නො වේ. කපිල පීරිස් මහතාගේ ව්‍යායාමයෙහි අවසානයෙහි දී ගැමියන් හා නිලධාරීන් තව තවත් නිව්ටන් වැළඳ ගෙන වැව් ගොඩ කිරීමක් දක්වා ද යනු ඇත. මේ ව්‍යායාමයෙන් කපිල පීරිස් මහතාට බටහිර සංවර්ධන ආකෘතියට අබමල් රේණුවක පමණ පහරක් ගැසිය නො හැකි ය. ඔහු කරන්නේ ඒ තව තවත් තහවුරු කිරීමකි. ඉංජිනේරු ක්ෂෙත්‍රයෙහි අපේ ප්‍රවාද නොදන්නේ නම් කපිල පීරිස් මහතා කළ යුත්තේ එක්කෝ මහන්සි වී ඒ දැනගැනීමට උත්සාහ කිරීම ය. නැත්නම් වෙනත් අයකු ඒ පිළිබඳ අධ්‍යයනයක් කරන තෙක් මහන්සි නොවී සිටීම ය. අද ඔහු කරන්නේ බටහිර සංවර්ධන ආකෘතිය නම් අතීසාරයට අමුඩ ගැසීමක් වත් නො වේ. අතීසාරය තව තවත් ව්‍යාප්ත කිරීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva